# ථෙරවාද බුදු සමයේ අන්තර්ගත ධ්‍යාන සුඛ පිළිබඳ විමර්ශනයක්

ඉරෝමී ආරියරත්න

## හැඳින්වීම

නිර්වාණාභිමුඛ ව බුසදුමයේ හික්මෙන ධ්‍යානයෝගියෙකු විසින් වින්දනය කරනු ලබන සුඛ කොට්ඨාශයක් ලෙස ධ්‍යාන සුඛයන්ට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. සරල ම අර්ථයෙන් ප්‍රකාශ කරන්නේ නම් ධ්‍යාන සුඛ යනු බුදුසමයේ අනුඥාත ධ්‍යාන වඩන්නනෙකු විසින් අනුක්‍රමික ව වින්දනය කරන්නා වූ සුඛයන් ය. ථෙරවාද බෞද්ධ සාහිත්‍යයේ ධ්‍යාන යෝගියෙකු හට වින්දනය කළ හැකි සුඛ වර්ග සුඛ නාම විසි පහක් (25) ඔස්සේ විග්‍රහ කර ඇත. එමෙන් ම, එම සුඛ වර්ග ධ්‍යාන සුඛ යන පොදු නාමයෙන් හැඳින්විය හැකි වෙයි. මෙම ශාස්ත්‍රීය ලිපියේ මූලික අභිලාෂය වන්නේ නිකාය සහ පශ්චාත් පෙටක ග්‍රන්ථ ඇසුරින් එකී සුඛයන් පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශනයක් සිදු කිරීම ය.

## නිකාය සාහිත්‍යයේ සඳහන් ධ්‍යාන සහ ඒවා විමුක්ති මාර්ගය සමඟ සම්බන්ධ වන ආකාරය

බෞද්ධ සම්ප්‍රදායය විසින් විග්‍රහ කර ඇති ධ්‍යානසුඛ සම්බන්ධයෙන් විවරණයකට එළඹීමට මත්තෙන් නිකාය සාහිත්‍යයේ එන ධ්‍යාන වර්ග හා ඒවා විමුක්ති මාර්ගය කෙරෙහි දක්වන සම්බන්ධතාව පිළිබඳ හැඳින්වීමක් සිදු කිරීම මෙහි ලා අවශ්‍ය කාරණයක් වෙයි. පෙළ සාහිත්‍යාගත සාධකයන්ට අනුකූල ව බෞද්ධ සාහිත්‍යයේ හමුවන ධ්‍යාන නවයකි. ඒ,

1. පඨමජ්ඣාන
2. දුතියජ්ඣාන
3. තතියජ්ඣාන
4. චතුත්ථජ්ඣාන
5. ආකාසානඤ්චායතනය
6. විඤ්ඤාණඤ්චායතනය
7. ආකිඤ්චඤ්ඤායතනය

8. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය හා

9. සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තිය යි.

බුදුසසුනේ විමුක්තිගාමී පුද්ගලයෙකු විසින් පිළිපැදිය යුතු ප්‍රතිපදාව වශයෙන් සූත්‍ර සාහිත්‍යයේ සඳහන් වන ප්‍රධාන ආකාර දෙකකි. ඒ,

1. පිළිවෙළින් ප්‍රථම ධ්‍යානයේ සිට සිව්වන ධ්‍යානය දක්වා සමවැදී සිව්වන ධ්‍යානයෙන් පසු සිත කර්මණ්‍ය, මෘදු, පහසුවෙන් විමුක්තිය කරා නැමිය හැකි ආකාරයට පත් වූ කල්හි අභිඥාවන් ඔස්සේ ආසවක්ඛය ඥානය පසක් කොට විමුක්තිය ලැබීම[1] හෝ

2. ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථධ්‍යානය දක්වා වඩා අභිඥාවන් පිණිස සිත යොමු නො කොට පිළිවෙළින් ඉහත කී පස්වැනි ධ්‍යානයේ සිට නවවැන්න දක්වා වන ධ්‍යානයන්ගේ විමෝක්ෂයෙන් අනතුරු ව අභිඥාවන් වඩා ආසවක්ඛය ඥානය පසක් කොට විමුක්තිය ලැබීම යනුවෙනි.

පෙළ සාහිත්‍යාගත සාධක ප්‍රකාර ව, උභතෝභාග විමුක්තිය කරා ළඟා වන ශ්‍රාවකයා විසින් වර්ධනය කළ යුතු ධ්‍යාන වශයෙන් දක්වා සිටින්නේ පෙර කී ආකාසානඤ්චායතන ධ්‍යානයේ පටන් සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තිය දක්වා වූ ධ්‍යානයන් මිස බුදුසමය හඳුන්වාදෙන ප්‍රතිපදාවේ හමුවන මූලික ධ්‍යානයන් ලෙස සැලකෙන ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථධ්‍යාන දක්වා වන ධ්‍යානයන් නො වේ. විමර්ශනාක්ෂිය යොමු කිරීමෙන් පැහැදිලි වන කාරණයක් වන්නේ ඉහත කී පළමු ධ්‍යානයේ සිට සිව්වැන්න දක්වා වූ ධ්‍යාන නිර්වාණ මාර්ගයේ ආවශ්‍යකත්වය සලකා බුද්ධ කාලීන ධ්‍යානයන් අතරට බුදු සමයෙන් යෝජිත ධ්‍යානයන් වන බව ය. එකී ධ්‍යාන හුදෙක් උපයාගත හැක්කේ බුදුසමය විසින් අනුඥාත කුසල ධර්ම භාවනය කිරීමෙන් පමණක් බව සූත්‍ර සාහිත්‍යය ඔස්සේ පැහැදිලි වේ. විශේෂයෙන් ම, සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ආළාර කාලාම හා උද්දකරාමපුත්ත යන තවුසන් දෙදෙනා විසින් කුසලභාවනයෙන් තොර ව පුහුණු කළ ආකිඤ්චඤ්ඤායතනය හා නේවසඤ්ඤානාසඤ්ඤායතන යන ධ්‍යානයන් ද බැහැර කරමින් කුසලය කුමක්දැයි සොයනු පිණිස මගධයෙහි උරුවේල ග්‍රාමයට වැඩම කොට, සය වසක් පමණ කාය තාපනයෙන් යුක්ත අප්පාණක ධ්‍යානය වැඩූ අන්දමත්, එහි ආදීනවය පසක් කොටගෙන සම්බෝධිය පිණිස උපයුක්ත වන නිවැරදි මඟ වප්මඟුල් දිනයේ තමන් වහන්සේ විසින් තනි ව වැඩූ ධ්‍යානය ම වන්නේ දැයි සිතා පඨමජ්ඣානය කෙරෙහි සිත යොමු කරමින් පිළිවෙළින් සිව්වැනි ධ්‍යානය දක්වා වඩා අනතුරු ව අභිඤ්ඤාවන් කෙරෙහි සිත යොමු කොට සත්‍යය පසක් කොට ගත් ආකාරයත් මහාසච්චක සූත්‍රය පෙන්වා දෙයි.[2]

පස්වැන්නේ සිට අටවැන්න දක්වා වන ධ්‍යානයන්ගෙන් සිදු කෙරෙන්නේ ඒ ඒ ධ්‍යානයන් වඩා එකී අනුභූතියට සරිලන සත්වාවාසයන්හි උපත ලැබූවන් විසින් විඳින අත්දැකීම් වින්දනය කිරීම ය.[3] නව වැනි ධ්‍යානයෙන් සිදු කෙරෙන්නේ සංඥා

හා වේදනයන් තාවකාලික ව නිරෝධය කිරීමෙන් නාම කාය තාවකාලික ව නිශ්චල තත්වයට පත් කිරීම ය.

කෙසේ නමුත්, බ්‍රහ්මචර්යාව උදෙසා මෙකී ධ්‍යාන ප්‍රගුණ කිරීම අනුදකින්නේ ප්‍රධාන හේතු කිහිපයක් නිසා බව පෙනේ. ඉන් පළමුවැන්න නම්, පළමු ධ්‍යානයේ සිට සිව්වන ධ්‍යානය දක්වා ලබන පුහුණුවෙන් බුදු සමය අනුදකින අභිඥාවන් කරා සිත යොමු කොට ආශ්‍රව ක්ෂය කිරීම පිණිස පහසුවෙන් නැමිය හැකි ආකාරයට සිත පත් කිරීමට පහසුවක් වනු පිණිස ය. සූත්‍ර දේශනාවන්හි සඳහන් වන පරිදි පිළිවෙළින් ප්‍රථම, දෙවන, තෙවන සහ චතුර්ථධ්‍යාන පසු කරන පුද්ගලයාගේ සිත වහා සමාධිගත වේ. එබඳු තැනැත්තාගේ සිත විමුක්තිය කෙරෙහි යොමු කිරීමට යෝග්‍ය වෙයි. **දීඝ නිකායේ** සාමඤ්ඤඵල සූත්‍රය සහ තවත් සූත්‍ර ධර්ම රාශියක සඳහන් වන පරිදි චතුර්ථධ්‍යානයට පත් වීමෙන් අනතුරු ව සිත පිරිසිදු ව, දීප්තිමත් ව, කෙලෙස් යටපත් ව, උපක්ලේශයන්ගෙන් පහ ව, මෘදු ව කර්මණ්‍ය ව, නිශ්චල බවට පැමිණේ. අනතුරු ව විදර්ශනාව කෙරෙහි සිත අභිමුඛ කෙරේ.[4] **මජ්ඣිම නිකායේ** පෝතලිය සූත්‍රයේ දී නිර්වාණය අරබයා චතුර්ථ ධ්‍යානයේ ඇති වැදගත්කම මොනවට පැහැදිලි කර ඇත.[5]

දෙවැනි කාරණය අදාළ වන්නේ පෙර කී පස්වැනි ධ්‍යානයේ සිට ඉදිරියට ඇති ධ්‍යාන උදෙසා ය. විශේෂයෙන් ම, ආකාසානඤ්චායතනයේ සිට නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා ම වන ධ්‍යානභූමි එකී ධ්‍යානයන්ට අනුරූප වන සත්වලෝකවල උපත ලබන්නන් විසින් වින්දනය කරන අත්දැකීම හා සමාන වන බව පෙර සඳහන් කරන්නට යෙදුණි එමෙන් ම, කාම ලෝකයන් අබිබවා ඉහළ මට්ටමක පවතින ලෝක වශයෙන් හැඳින්විය හැකි මෙකී ලෝකයන්හි උපත ලබන්නේ ඒ ඒ ධ්‍යානයන්ට හිමි අනුභූතිය වින්දනය කරන්නන් ය. සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියත් ඇතුළු ව, දිට්ඨධම්මික වශයෙන් එකී අනුභූතීන් වින්දනය කිරීමට පුද්ගලයා යොමු කිරීමෙන් එකී වින්දනයන්ගේ තාවකාලික අස්සාදයත්, එහි ආදීනවයත් දැන නිස්සරණයෙන් එම අනුභූතීන්ගෙන් විමුක්තිය ලබා ගැනීමට ඉඩ සැලසීම බෞද්ධ ධ්‍යාන ප්‍රතිපදාවේ ප්‍රධාන කාර්යභාරයකි. පෙර කී මහානිදාන සූත්‍රයෙන් ඒ බව මනාව පැහැදිලි වේ.[6] එමෙන් ම, **අංගුත්තර නිකායේ** නවක නිපාතයේ ගාවීඋපමා සූත්‍රයේ සඳහන් වන පරිදි ඉහත කී සියලු ම ධ්‍යානයන් තුළින් නැඟී සිටින ධ්‍යාන යෝගියාගේ සිත මෘදු, කර්මණ්‍ය වන අතර, විශිෂ්ට ඥානයක් දැන සාක්ෂාත් කරනට හෙවත් නිර්වාණාවබෝධයට යොමු කිරීමට සුදුසු බවට පැමිණේ.[7]

## ධ්‍යාන යෝගියාගේ ස්වභාවය සහ සුඛ වින්දනය

පිළිවෙළින් බෞද්ධ ප්‍රතිපදාවෙහි ඉදිරියට ඇදෙන කුසල සම්පන්න බුද්ධ ශ්‍රාවකයා තමන් විසින් පවත්වන්නා වූ සියලු ම ඉරියව් ස්මෘති සම්පන්න ව ම පැවැත්වීමෙන් ඉතරීතර සංතුට්ඨියී[8] පියාපත් බරින් පමණක් යුක්ත වන පක්ෂියෙකු බඳු මෙම ශ්‍රාවකයා අනතුරු ව අරඤ්ඤ, රුක්මුල්, පර්වත, කඳුරැලි, ගිරිගුහා, සුසාන ආදි ජනශුන්‍ය සෙනසුනක් භජනය කරමින් උඩුකය ඍජු කොට පලක් බැඳ

කමටහනට අභිමුඛ කොට සිහිය එළවා ගනී.[9] හෙතෙම පඤ්ච උපාදානස්ඛන්ධය කෙරෙහි ඇල්ම හැර, යටපත් කිරීම හේතුවෙන් ව්‍යාපාද රහිත සිතැති ව, සියලු ම ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පී ව වාසය කරයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කරයි. ථිනමිද්ධය හැර දමා දිවා රෑ දෙකේ ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥාව ඇතිව සිහිනුවණින් යුක්ත ව වෙසේ. උද්ධච්ච කුක්කුච්චයත් සිතින් දුරලා විචිකිච්ඡාව හෙවත් සැකය සිතින් පහ කරමින් කුසල් දහම් කෙරෙහි සැක නැතිව ජීවත් වෙයි. මෙසේ තමා කෙරෙහි පහ වූ නීවරණ සහිත බව දකින ඔහුට පාමොජ්ජය උපදී. එකී බලවත් වූ ප්‍රමෝදය හේතුවෙන් ප්‍රීතිය උපදී. එකී ප්‍රීතිය හේතුවෙන් එම තැනැත්තාගේ නාම-කාය සන්සිඳේ. සන්සිඳුණු නාම-කාය ඇති තැනැත්තා සුව විඳී. සුව විඳින්නාගේ සිත සමාධිගත වේ.

බෞද්ධ සාහිත්‍යයේ කෙරෙන විවරණයන්ට අනුකූල ව ධ්‍යාන යෝගියෙකුගේ සිත සමාධියට පත්වීමට ආසන්න වත් ම පහළ වන සිතෙහි ස්වභාවයන් ලෙස අප්පණාව හා උපචාරය හඳුන්වයි. පාලි-ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව අප්පණාව යනු මාර්ගාභිමුඛ පුද්ගලයකුගේ මනසෙහි ස්වභාවය වෙයි.[10] උපචාරය යනු ධ්‍යාන මාර්ගයට පිළිපන්, එහෙත් ධ්‍යානාධිගමයට පත් නො වූ අයගේ මනසේ ස්වභාවය යි.[11] මෙකී අප්පණාවට හෝ උපචාරයට පැමිණි තැන් පටන් පුද්ගලයා වින්දනය කරන සුඛය සඳහා පොදු නාමයක් ලෙස පෙළ සාහිත්‍යයේ 'සමාධිසුඛ' යන්න යොදා තිබේ.[12] මෙසේ සිත සමාධිගත වන සියලු ම අවස්ථාවන්හි දී මාර්ගස්ථ හෝ ක්ෂීණාශ්‍රව යන උභය පුද්ගලයන්ට ම සමාධිසුඛය වින්දනය කළ හැකි ය. දීඝනිකායේ අටුවාවට අනුව සමාධිසුඛ යන්න ප්‍රත්‍යුත්පන්නයෙහි හා අනාගතයෙහි ද සුඛ විපාක සලසන්නක් ම වන අතර, අරහත්ඵල සමාධිය දක්වා වූ සියලු ම සමාධීන් පූර්වාපර වශයෙන් වැඩීමෙන් උපදින සුඛයක් ලෙස දක්වාල යි.[13] එමෙන් ම, **අංගුත්තර නිකායේ** දුක නිපාතයේ සඳහන් වන 'අසමාධිසුඛ' යන්නට අරුත් දක්වන අටුවාව ප්‍රකාශ කරන්නේ පෙර කී අර්පණාවට හෝ උපචාරයට නො පැමිණ ලබන සුඛ වශයෙනි.[14]

## ථෙරවාද බුදුසමයේ සඳහන් ධ්‍යාන සුඛ

ථෙරවාද බෞද්ධ සාහිත්‍යයට අනුව ධ්‍යාන සුඛ යන වදන ප්‍රථමයෙන් හමුවන්නේ අභිධම්මපිටකයේ **කථාවත්ථුප්පකරණයේ** දී ය. එහෙත්, ධ්‍යාන සුඛ යන නාමය මිස ඒ සඳහා කරන ලද අරුත් දැක්වීමක් එහි ලා අන්තර්ගත නො වේ. ධ්‍යානඵලයන්ගේ ආස්වාදය වශයෙන් වින්දනය කරන සුවය ධ්‍යාන සුඛ යනුවෙන් බෞද්ධ සාහිත්‍යයේ ව්‍යවහාර වන වදනෙහි අරුත වන බව **සංයුත්තනිකායේ** ටීකාවට අනුව පැහැදිලි වේ.[15] එම ටීකාව තවදුරටත් පෙන්වා දෙන්නේ කුසලසහගත ධ්‍යානයන්ගේ විපාක වශයෙන් ලබන සුඛය ධ්‍යාන සුඛය නම් ලබන බව යි.[16] පොට්ඨපාද සූත්‍රයේ ටීකාවට අනුව ධ්‍යාන සුඛය යනු එකී ධ්‍යානයට සමවැදෙන්නා විසින් ආත්මීය වශයෙන් විඳින්නා වූ සුඛයකි.[17]

බුදුසමයේ බහුල ව හමුවන ප්‍රධානත ම සුඛ වර්ගීකරණයක් වන කායික සුඛ හා චෛතසික සුඛ යන සුඛ වර්ග දෙක ම ධ්‍යානයෝගියා විෂයෙහි උත්පාදනය කරන්නාවූ

සුඛ කොට්ඨාශයක් ලෙස ධ්‍යාන සුඛ හැඳින්වීම වරදක් නො වේ. අනෙකුත් සියලු ම වෙදයිතයන් මෙන් ම සුඛය ද කයින් හා මනසින් වින්දනය කිරීම පුද්ගල ස්වභාවය යි. ලෞකික සුඛ වශයෙන් වින්දනය කරන කායික සුඛයන්ගේ ස්වභාවය නම් පඤ්ච ඉන්ද්‍රිය ප්‍රීණනයෙන් කය විසින් උපයාගනු ලබන සුඛය මානසික තෘප්තියක් දක්වා විශද කිරීම යි. ධ්‍යාන සුඛයන් තාවකාලික අනුභූතීන් වුව ද ඒවායේ ස්වභාවය වන්නේ ප්‍රථමයෙන් චෛතසික වශයන් සුඛ උපයාගෙන පසු ව එය කය කෙරෙහි ද සම්ප්‍රේෂණය කරවීම යි. නිදසුනක් ලෙස, ආර්ය මාර්ග සංඛ්‍යාත ප්‍රථම ධ්‍යානයේ දී ප්‍රීතිසුඛ වින්දනය කරන්නා එය මුලින් මනසින් විඳ අනතුරු ව කයින් ද පසක් කර ගන්නා බව බොහෝ ස්ථානයන්හි සඳහන් වේ.[18] සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වන පරිදි යම් සේ කපුවෙක් හෝ කපුවෙකුගේ අතවැස්සෙක් හෝ ලෝහ තලියක නාන දියසුණු බහා දිය ඉස ඉස පිඩු කරන්නේ ද, ඒ සුණු පිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් යුක්ත වූයේ, ඇතුළත පිටත මුළුල්ල ම දියෙන් පැතිර ගියේ දිය නො වගුරුවන්නේත් වේ ද, එසේ ම මහණ තෙම මේ කරජකය ම විවේකයෙන් උපන් ප්‍රීති සුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙමයි. පුරාලයි. මුළුල්ල ම ස්පර්ශ කරයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවෙකජ ප්‍රීති සුඛයෙන් පැතිර වැද නො ගත් කිසි ද තැනක් නො වෙයි.[19] මේ අනුව, බුදුසමයේ අනුඥාත ධ්‍යානසුඛ වින්දනයේ දී එය ප්‍රථමයෙන් මනසින් වින්දනය කොට පසු ව එය කයින් පසක් කර ගන්නා බව පෙනේ. අනෙක් අතට, පුද්ගලයාට ඉහාත්මයේ දී ම උපයාගතහැකි බැවින් ධ්‍යාන සුඛ දිට්ඨධම්ම සුඛයක් වශයෙන් ද හඳුන්වාදිය හැකි ය.

කෙසේ වෙතත්, බුදුසමයේ එන ධ්‍යානසුඛ සම්බන්ධයෙන් මෙහි ලා සඳහන් කළ යුතු වැදගත් කාරණයක් වන්නේ ඇතැම් විට වින්දනය කරන්නාගේ ස්වභාවය අනුව විශේෂතාවක් විද්‍යමාන වීම ය. එනම්, බුද්ධා දී රහත් උතුමන් විසින් ධ්‍යාන සුඛ වින්දනය කරන කල්හි උන් වහන්සේ එකී සුඛයන් නිරාමිස ව වින්දනය කරති. නමුදු, පෘථග්ජන අනාර්යන් විසින් එය වින්දනය කරන්නේ සාමිස අයුරිනි. කෙසේ වෙතත්, ධ්‍යාන අනුභූතීන් ද තාවකාලික සුඛයක් පමණක් උද්දීපනය කරන බව බුදුන් වහන්සේ අවධාරණය කොට ඇත. විශේෂයෙන් ම, ධ්‍යාන සුඛයන්ගේ ඖදාරික ස්වභාවය හේතුවෙන් ම එකී සුඛ අත්හැර පරම සුඛය සොයා යාමට බුදුන් වහන්සේ පෙළඹුණු අයුරු **මජ්ඣිම නිකායේ** පඤ්චත්තය සූත්‍රයේ දී උන් වහන්සේ විසින් ම පැහැදිලි කරනු ලැබ ඇත.[20] ඒ අනුව, බුදුසසුනේ භික්මෙන්නකු විසින් උපයා ගත යුතු උතුම් ම සුඛ බවට පත් වන්නේ ලෝකුත්තර හෙවත් නිර්වාණානුභූතිය ඔස්සේ උපයා ගන්නා සුඛයන් වීම විශේෂිත ය.

බෞද්ධ සුඛ සංකල්පයට අනුව පුද්ගලයාට වින්දනය කළ හැකි ධ්‍යාන සුඛය සුඛනාම විසි පහක් ඔස්සේ විග්‍රහ කර ඇත.

මෙම සුඛ ධ්‍යාන අනුභූතිය ඔස්සේ වින්දනය කරන ආකාරය මෙ තැන් පටන් සාකච්ඡා කිරීමට අභිමත ය. පෙර සඳහන් කළ පරිදි තම සිත සමාධිගත වන්නට වූ තැන් පටන් එම ශ්‍රාවකයා පිළිවෙළින් ධ්‍යාන අනුභූතිය වින්දනය කරන බව බුදුසමය පෙන්වා දෙයි.

## සප්පීතිකසුඛ

සූත්‍ර සාහිත්‍යයේ අන්තර්ගත විග්‍රහයන්ට අනුව 'සප්පීතිකසුඛය' හෙවත් 'පීතිසුඛය' යනු පඨම හා දුතිය ධ්‍යානයන්ගෙන් උපදින සුඛය වෙයි.[21] අටුවා හා ටීකා ග්‍රන්ථයන්හි එන බොහෝ විග්‍රහයන්ට අනුව 'සප්පීතිකාරම්මණසුඛ' වශයෙන් නම් ලබන්නේ ද සප්පීතික ධ්‍යාන දෙක හෙවත්, පඨම හා දුතිය ධ්‍යානයන් ප්‍රත්‍යවේක්ෂණයෙන් උපදින සුඛය යි.[22] සූත්‍රාගත විවරණයන්හි දී එකී ධ්‍යාන දෙකෙහි අත්දැකීම් අනුව සප්පීතිකසුඛය ආකාර දෙකකට වර්ග කර ඇත. ඒ,

1. 'විවෙකජ පීතිසුඛය'හා
2. 'සමාධිජ පීතිසුඛය' යනුවෙනි.

## විවෙකජ පීතිසුඛය

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ප්‍රථම ධ්‍යානය සම්බන්ධයෙන් වන විවරණයන්ට අනුව ධ්‍යානයෝගියා කාමයෙන් හා සෙසු අකුසල් දහමින් වෙන් වෙයි. එමෙන් ම, එම අවස්ථාවේ දී ඔහුට විතක්ක, විචාර යන ද්විවිධ ධර්ම පවතී. නීවරණ පහවීමෙන් උපන් විවේකය හේතුවෙන් ඔහුට ප්‍රීතිසුඛය පහළ වෙයි.[23] අටුවා හා ටීකා සාහිත්‍යයේ දී '**පඨමජ්ඣානසුඛං**' යනුවෙන් ව්‍යවහාර වන්නේ ද මෙය ම වේ.[24] මෙසේ විවේකය හේතුවෙන් පීතිසුඛය උපයා ගන්නා ධ්‍යානයෝගියා එකී පීතිසුඛය වින්දනය කරන ආකාරය ද සූත්‍ර සාහිත්‍යයේ සඳහන් කර ඇත. ඒ අනුව ඔහු තම මුළු කය ම පීතිසුඛයෙන් තෙමයි. පුරවයි. එකී සුඛයෙන් මුළු කය ම ස්ඵර්ශ කරයි. එවිට ඔහුගේ කයෙහි වන සියලු ම අඟපසඟයන් අතර එකී විවෙකජ පීතිසුඛය පැතිර වැද නොගත් කිසිදු ස්ථානයක් නො වේ.[25] මෙකී සුඛ වින්දන ක්‍රියාවලිය උපමාවකට නගා දක්වන බුදුන් වහන්සේ ප්‍රකාශ කර සිටින්නේ යම් සේ කපුවෙක් හෝ ඔහුගේ අතවැසියෙක් ලෝහ තලියක නානසුණු බහා දිය ඉස පිඬු කරන්නේ ද, එකී නානසුණු පිඬ කා වැදුණු දිය ඇති ව, සියලු තැන්හි ම දියෙන් යුක්ත වෙමින්, එයින් දිය නො වගුරුවන්නා සේ ඔහු තම කය පුරාවට ම එකී පීතිසුඛය සම්ප්‍රේෂණය කරන බව යි. මේ අනුව, පඨමජ්ඣානයෙන් බෞද්ධ භික්ෂුවකට උපයාගත හැකි සැපය ලෙස සැලකෙන්නේ පඤ්චනීවරණ යටපත් කිරීම හේතුවෙන් උපදින විවේකයෙන් උපදින සුවය යි.

## සමාධිජ පීතිසුඛය

එසේ ප්‍රථම ධ්‍යානයෙහි අත්දැකීම වින්දනය කරන ධ්‍යානයෝගියා අනතුරු ව පිවිසෙන්නේ දෙවන ධ්‍යානයෙහි අත්දැකීමට ය. මෙහි දී චිත්ත ඒකාග්‍රතාවෙන් යුක්ත එකී යෝගාවචරයාට විතර්ක විචාරයන් පහව සමාධියෙන් උපදින ප්‍රීතිසුඛය පහළ වෙයි. එසේ දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරන එම තැනැත්තා සමාධියෙන් උපන් ප්‍රීති සුඛයෙන් ඔහුගේ මුළු කය ම තෙමයි. හාත්පස පතුරුවයි. එම අවස්ථාවේ දී ඔහුගේ මුළු කයෙහි සමාධියෙන් උපන් ප්‍රීති සුඛයෙන් පැතිර වැද නො ගත් කිසිදු තැනක් නො වේ. එය ද උපමාවකට නගා දක්වන බුදුන් වහන්සේ ප්‍රකාශ කර

සිටින්නේ යම් සේ යට උල්පත ඇති ගැඹුරු විලක් වේ ද, එයට පෙර දිගෙන්, දකුණු දිගෙන්, බටහිර දිගෙන් හෝ උතුරු දිගෙන් දිය ඇතුළු වන මඟක් නො වන්නේ වුවත්, වැස්ස ද කලින් කල සුදුසු පරිදි නො වසින්නේ වුවත්, එකී විලෙන් ම සිහිල් දිය මතු වෙමින් එය හාත්පස පතුරුවන්නේ ය, සිහිල් දියෙන් තෙමන්නේ ය, එම විල පුරවන්නේ ය. එවිට එම විලෙහි සිහිල් දිය පැතිර ගත් කිසිදු තැනක් නො වන්නාසේ ඉහත කී යෝගාවචරයාගේ ද කයෙහි සමාධිජ පීතිසුඛය නොපැතිරි තැනක් නො වන්නේ ය. මෙය දුතිය ධ්‍යානය හේතුවෙන් උපදින පීතිසුඛය වශයෙන් බුදුසමය විග්‍රහ කරයි.[26] එමෙන් ම, ද්විතියය ධ්‍යානයෙහි විපාක වශයෙන් උපදින බැවින් මෙම සුඛය 'දුතියජ්ඣානසුඛ' යනුවෙන් අටුවා හා ටීකා සාහිත්‍යයේ දී හඳුන්වා ඇත.

## නිප්පීතිකසුඛ

පෙළ සාහිත්‍යාගත විවරණයන්ට අනුව නිප්පීතිකසුඛ යනුවෙන් හඳුන්වා ඇත්තේ තතියජ්ඣානයෙන් සහ චතුත්ථජ්ඣානයෙන් උපදින සුඛ බව පෙනේ. අටුවා විවරණයන්ට අනුව මෙම තෙවන සහ සිව්වන ධ්‍යානයන්ගේ විපාක වශයෙන් උපදින සුඛය පිළිවෙළින්,

1. 'තතියජ්ඣානසුඛ' හා
2. 'චතුත්ථජ්ඣානසුඛ' යනුවෙන් විග්‍රහ කොට ඇත.[27]

## තතියජ්ඣානසුඛ

සූත්‍ර සාහිත්‍යයේ සඳහන් වන පරිදි තෘතිය ධ්‍යාන අනුභූතියේ දී පුද්ගලයා ඉහත කී ප්‍රීතියේ විරාගයෙන් හෙවත් එය පහවීමෙන් උපන් උපේක්ෂාවෙන් යුක්ත වෙයි. මනා සිහියෙන් හා නුවණින් යුක්ත වන මෙම ධ්‍යානයෝගියා එයින් සුඛ වින්දනය කරන අතර, එය 'නිප්පීතිකසුඛය' යනුවෙන් හැඳින් වේ.[28] මෙකී සුඛ වින්දනයේ ස්වභාවය විග්‍රහ කරන බුදුන් වහන්සේ ප්‍රකාශ කර සිටින්නේ යම් පරිදි උපුල් විලෙක, පඬෙර විලෙක හෝ පියුම් විලෙක උපන් උපුල්, පඬෙර හෝ පියුම් දියෙන් ඉපිද, දියෙහි වැඩී, දියෙන් නො නැඟී, දිය තුළ ම ගිලී වැඩුණේ ද, ඒ හැම අග දක්වාත්, මුල් දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ, හැම පරිදි තෙත් වූයේ ද, පිරී ගියේ ද, හැම තැන්හි ම පැතිර වැදගත්තේ වී ද, ඒ විලෙහි ඇති එකී සියලු ම මල්වල සිහිල් දිය පැතිර වැද නො ගත් තැනක් නො වන්නා සේ එම ධ්‍යානලාභියා තමාගේ මුළු කය ම එකී නිප්පීතික සුඛයෙන් තෙමයි. පුරවයි. එවිට ඔහුගේ කයෙහි එම සුවය පැතිර වැද නොගත් තැනක් නො වේ.[29]

**මජ්ඣිම නිකායේ** පඤ්චත්තය සූත්‍රයේ සඳහන් වන අන්දමට තතියජ්ඣාන අනුභූතියේ දී වින්දනය කරන සුඛය වන්නේ නිරාමිසසුඛය යි.[30] අටුවා හා ටීකා සාහිත්‍යයේ ද තෘතිය ධ්‍යාන සංඛ්‍යාත වූ සුඛය ම 'නිරාමිසසුඛ' යනුවෙන් හඳුන්වා ඇත.[31] විශේෂයෙන් බෞද්ධ ප්‍රතිපදාවෙහි අනුදත් ධ්‍යාන මාර්ගයෙහි ගමන් කරන්නා සියලු ම කාම සහ අකුසල මනෝභාවයන් දුරලා ඉදිරියට ගමන් කිරීමේ දී හමුවන තෙවැනි ධ්‍යානය නම් සන්ධිස්ථානයේ දී පියාපත් බරින් පමණක් යුතු

පක්ෂියෙකු සේ තම කයෙන් උපදින සංවේදනයන් පිළිබඳ මනා සිහි ඇති ව එකී නිප්පීතිකසුඛය කය කෙරෙහි සම්ප්‍රේෂණය කරයි. එහෙත් එම සුඛය සම්බන්ධයෙන් සහ උපේක්ෂාවක් මිස සාමිස වශයෙන් පවතින ඇල්මක් ඔහුට නො පවතී. එමෙන් ම, පඤ්චකාම ගුණය ප්‍රත්‍ය වූ කිසිදු ආකාර වින්දනයක් නොමැති හෙයින් ඔහුට සාමිස වශයෙන් පවතින වින්දනයක් නො වේ. පශ්චාත්කාලීන පාලි ග්‍රන්ථයක් ලෙස සැලකෙන **අනුදීපනීපාඨයෙහි** ධ්‍යානසුඛ, මග්ගසුඛ, ඵලසුඛ හා නිබ්බාණසුඛ යන සියල්ල නිරාමිස සුඛ වන බව දක්වා ඇත.[32] එමෙන් ම, ධ්‍යානයන්ට සමවදින රහතන් වහන්සේට මෙකී තතියජ්ඣානසංඛ්‍යාත නිරාමිස සුවය වින්දනය කිරීමේ හැකියාව ද, නිවනින් මෙපිට ඇති සියලු ම යහපත් වූ දිට්ඨධම්මිකසුඛ නිරාමිස ව වින්දනය කිරීමේ හැකියාව ද පවතී.

චක්කවත්ති සීහනාද සූත්‍රයට විවරණ සපයන ටීකාව ධ්‍යාන අනුභූතියෙන් උපදින සුඛ වර්ග හතරක නාමාවලියක් දක්වමින් තතියජ්ඣානයේ දී වින්දනය කළ හැකි වන්නේ 'අපීතිජං කායසුඛං' බව පෙන්වා දෙයි.[33] මෙය තුන්වැනි ධ්‍යානයෙන් උපදින සුඛය හැඳින්වීම උදෙසා වඩාත් යෝග්‍ය පර්යාය නාමයක් වන්නේ සිව්වැනි ධ්‍යානයේ දී ධ්‍යානයෝගියා කායික සුඛ වින්දනීය අරමුණින් බැහැර වී ඥානසම්ප්‍රයුක්ත වූ මානසික සුඛ වින්දනය කරා යොමු වන බැවිනි.

මේ හැරුණු විට, ධ්‍යාන සුඛයන්ට අදාළ ව **අංගුත්තර නිකායේ** දුක නිපාතයේ යෙදී ඇති 'සාතසුඛ' යන්න ඉහත කී ධ්‍යාන තුනෙන් ම උපදින සුඛ සඳහා යොදන පොදු නාමයක් ලෙස එහි අටුවාවේ දී හඳුන්වා ඇත.[34] අර්ථ වශයෙන් ගත් කල සාතසුඛ යන්න මිහිරිසුඛ වශයෙන් පරිවර්තනය කළ හැකි ය. **අංගුත්තර නිකායේ ටීකාවේ** දී පළමු ධ්‍යාන ත්‍රිත්වය වින්දනය කිරීමේ දී සුඛින්ද්‍රියයාගේ වින්දනයේ ප්‍රතිඵලයක් ලෙස සාත සුඛය කායික ව වින්දනය කරන බවත්, සොමනස්සින්ද්‍රියාගේ ප්‍රතිඵයක් ලෙස එකී අනුභූතීන් මානසික වශයෙන් වින්දනය කරන බවත් ඉන්ද්‍රිය සංයුත්තයේ සුඛින්ද්‍රිය වග්ගයෙහි එන සූත්‍රානුසාරයෙන් පැහැදිලි වේ.[35] **අංගුත්තර නිකායේ** දුක නිපාතයේ 'සාතාරම්මණසුඛ'යනුවෙන් ඉහත කී ධ්‍යානයන්ගේ අනුභූතීන් නැවත නැවත මෙනෙහි කිරීමෙන් උපදින සුඛය දක්වා ඇත.[36] මේ අනුව, ධ්‍යානයෝගී මාර්ගස්ථ පුද්ගලයෙකු විසින් ප්‍රථම ධ්‍යාන තුන ම ඇසුරින් වින්දනය කළ හැකි සුඛයක් ලෙස සාතසුඛ හැඳින්විය හැකි වෙයි.

## චතුත්ථජ්ඣානසුඛ

සූත්‍ර සාහිත්‍යාගත සාධක අනුව චතුර්ථධ්‍යානසංඛ්‍යාත අත්දැකීම ලෙස විග්‍රහ කර ඇත්තේ සුඛ වේදනාව ද දුරලීමෙන්, දුක්ඛ වේදනාව ද දුරලීමෙන්, ප්‍රථම වරට සොම්නස් හා දොම්නස් යන දෙදෙනාගේ ම පහවීමෙන් දුක් ද නො වූ සුඛ ද නො වූ උපේක්ෂා සහ ස්මෘතියෙහි පිරිසිදු බව ඇතිව වාසය කිරීම ලෙස යි. මේ අනුව, සුඛ දුක්ඛ දෙක ම පහ වූ තත්වය හෙවත් අදුක්ඛමසුඛ හෙවත් උපේක්ඛාව අනුභූතික වශයෙන් වින්දනය කරන බව පෙනේ. එකී උපේක්ඛා වින්දනය උපමාවකට නඟා දක්වන බුදුන් වහන්සේ ප්‍රකාශ කරන්නේ යම් සේ පුරුෂයෙක් සුදුවතින් හිස සිට

පෙරවාගෙන සිටින්නේ නම් ඔහු ගේ කයෙහි සුදුවතින් නො වැසුණු කිසිදු තැනක් නො වන්නා සේ එකී මහණහුගේ කය ම පිරිසිදු වූ සිතින් පැහැර වැදගෙන නො සිටින තැනක් නො වන්නේ ය යනුවෙනි.[37] එමෙන් ම, උපේක්ෂාව හේතුවෙන් උපදින මෙකී සුඛයට පර්යාය වශයෙන් සූත්‍ර සාහිත්‍යයේ ස්ථාන රාශියක ම 'උපේක්ඛාසුඛ' යන වදන ද ව්‍යවහාර කරන බව පෙනේ.[38] එමෙන් ම, අංගුත්තරනිකායේ දුක නිපාතයේ සඳහන් වන 'රූපාරම්මණසුඛ' යනුවෙන් අදහස් කෙරෙන්නේ රූපජ්ඣානයක් ලෙස සැලකෙන මෙකී චතුත්ථජ්ඣානය ප්‍රත්‍යවේක්ෂණය කිරීමෙන් උපදින සුඛය වන බව අටුවාව ප්‍රකාශ කරයි.[39] මේ හැරුණු විට, එකී නිකායේ ම එන 'උපේක්ඛාරම්මණසුඛ' යනුවෙන් අර්ථ දක්වෙන්නේ ද චතුර්ථධ්‍යානසංඛ්‍යාත උපේක්ඛා අනුභූතිය ප්‍රත්‍යවේක්ෂණයෙන් උපදින සුඛය ලෙස හැඳින්විය හැකි ය.[40] **අංගුත්තරනිකායේ** ටීකාව චතුර්ථධ්‍යානයේ දී සිදුවන මනා චිත්ත පාරිසුද්ධියත්, සිතෙහි කර්මණ්‍ය බවත් හේතුවෙන් උපදින සුඛය 'සතිපාරිසුද්ධිජඤාණසුඛ' යනුවෙන් හඳුන්වයි.[41]

ඉහත කී තතිය හා චතුත්ථජ්ඣාන යන ද්විත්වයෙහි ම විපාක වශයෙන් උත්පාදනය වන සුඛයන් පොදුවේ හැඳින්වීම පිණිස 'නිප්පීතිකසුඛ' යන නාමය යොදා ඇති බව බෞද්ධ සාහිත්‍යයෙන් පැහැදිලි වේ. **අංගුත්තර නිකායේ** දුක නිපාතයේ අටුවාවට අනුව 'නිප්පීතිකාරම්මණසුඛ' වශයෙන් හඳුන්වන්නේ මෙකී ධ්‍යාන ද්විත්වය ප්‍රත්‍යවේක්ෂණය කිරීමෙන් උපදින සුඛය යි.[42]

**අරූපාරම්මණසුඛ**

බෞද්ධ ධ්‍යාන විග්‍රහයට අනුව පස්වන ධ්‍යානය ලෙස සැලකෙන්නේ රූප සංඥාවන්ගේ සමතික්‍රමණයෙන්, ප්‍රතිඝසඤ්ඤාවන්ගේ අස්තංගමයෙන්, නානාත්ත සඤ්ඤාවන්ගේ අමනසිකාරයෙන් යුතු වූ ආකාසානඤ්චායතනය යි. එහි සමවැදෙන්නාට පවතින්නේ වෙදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ අත්දැකීම් පමණි. හයවැනි ධ්‍යාන අනුභූතිය ලෙස සැලකෙන්නේ විඤ්ඤාණඤ්චායතනය වන අතර, එහි දී විඤ්ඤාණය අනන්තයැයි, ස්ථිරයැයි සිතැතිව වසයි. හත්වැන්නෙහි දී විඤ්ඤාණය ද අනිත්‍යය, අනන්ත වූ විඤ්ඤාණයක් ද නැතැයි යනුවෙන් වටහාගෙන ස්ථිර වූ කිසිවක් නැතැයි දැන, සඤ්ඤාව සහ වේදනය පමණක් ඇති මනසින් යුක්ත ව ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. අනතුරු ව එළඹෙන අටවැන්න වන නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයේ දී සඤ්ඤාව ඇත්තේ ද නැත්තේ ද නො වේ යන ස්වභාව ඇති ව වාසය කරන අතර, නවවැන්නේ දී සංඥාව හා වේදනය ද දුරලූ කයින් යුක්ත ව වාසය කරයි.

බුදු සමයේ එන සුඛ සංකල්පයට අනුව ඉහත කී හතර වැනි ධ්‍යානයෙන් පසු ව එන සෙසු ධ්‍යාන අරබයා හඳුන්වා දී ඇත්තේ එක් සුඛ නාමයක් පමණක් වීම සුවිශේෂ ය. ඒ, **අංගුත්තර නිකායේ** එන 'අරූපාරම්මණසුඛ' යන නාමය යි. මෙය ඉහත සඳහන් කරන්නට යෙදුණු බුදු සමය විසින් අරූපජ්ඣාන වශයෙන් හඳුන්වනු ලැබ ඇති පස්වැනි ධ්‍යානයේ සිට හත්වැනි ධ්‍යානය දක්වා වූ අනුභූතීන්ගෙන්

වින්දනය කරන සුඛය ලෙස විග්‍රහ කළ හැකි ය.[43] නමුත් **මජ්ඣිම නිකායේ** බහුවේදනීය සූත්‍රයේ දී බුදුන් වහන්සේ ධ්‍යාන සියල්ලෙන් ම සුඛ උත්පාදනය වන බව ප්‍රකාශ කොට ඇත.[44]

## සමථසුඛ

කෙසේ වෙනත් ධ්‍යාන අනුභූතීන්ගෙන් උපයාගන්නා සුඛ සියල්ලට ම පොදුවේ ව්‍යවහාර කළ හැකි සුඛ නාමයක් ලෙස '**සමථසුඛ**' යන්න හැඳින්විය හැකි ය. ටීකා සාහිත්‍යයෙහි පමණක් හමුවන සමථසුඛ යන්න බොහෝවිට විපස්සනාසුඛ යන්න සමඟ යුගල පදයක් වශයෙන් යෙදී ඇති අයුරු දැකගත හැකි ය. 'සමථ' යන්නට අරුත් සපයන **චූළනිද්දේසය** ප්‍රකාශ කරන්නේ සිත යම් අරමුණක නිසල ව පිහිටීමක්, මොනවට පිහිටීමක්, බැසගැනීමක්, (උද්ධච්චකුක්කුච්ච විසින් සිදු කරන අන්දමේ) සිතෙහි යම් පැතිරීමක් නොමැතිවීමක්, නොවිසිරුණු සිත ඇති බවක් හෝ යම් සමාධින්ද්‍රියක්, සමාධිබලයක් හෝ සම්‍යක් සමාධියක් හෝ වේ ද එය සමථය වන බව යි.[45] ඉහත සඳහන් කළ පරිදි නීවරණ යටපත් කිරීමෙන් උපදින පාමොජ්ජය හේතුවෙන් සුඛය පහළ වන බවත්, එයින් සිත සමාධිගත වන බවත් පෙන්වා දෙන්නට යෙදුණි. එමෙන් ම, ධ්‍යානාශක්ත පුද්ගලයා සතු ව සමාධිය පිහිටි බව දැනගන්නේ සිත අර්පණාවට හෝ උපචාරයට පැමිණි පසු ව බව ද සමාධිසුඛය පිළිබඳ කරන ලද විවරණයේ දී පැහැදිලි කරන්නට යෙදුණි තව ද, මාර්ග ආරම්භකක්ෂණයෙහි පූර්වභාගයේ දී ම සම්මාසමාධිය බැසගන්නා බව ද මහාලිසූත්‍ර අටුවාවෙහි සඳහන් වේ.[46] මේ අනුව, සිත සමාධිගත වූ තැන් පටන් ධ්‍යාන මාර්ගයේ දී වින්දනය කරන සියලු ම සුඛ වර්ග මෙකී සමථසුඛය යටතේ විග්‍රහ කළ හැකි බව සඳහන් කළ හැකි ය.

## ධ්‍යානසුඛයන්හි ස්වභාවය

ධ්‍යානසුඛයෙහි ස්වභාවය විස්තර කරන ජනවසභ සූත්‍රයේ අටුවාව, සමාපත්තියෙන් නැගී සිටින්නාට ධ්‍යානසුඛ හේතුවෙන් පූර්වාපර වශයෙන් සොම්නස උත්පාදනය වන බව පෙන්වා දෙයි.[47] **මජ්ඣිම නිකායේ ටීකාවේ** සඳහන් වන්නේ හටගත් බලවත් වූ ව්‍යාධිදුක්ඛයන් පවා අභිභවා සිටීමට ධ්‍යානසුඛයට හැකියාව ඇති බව ය.[48] මේ අනුව, කායික වශයෙන් පුද්ගලයෙකු වින්දනය කරන ඉහළ ම මට්ටමේ සුඛ වශයෙන් ධ්‍යානසුඛ විග්‍රහ කළ හැකි ය. විශේෂයෙන් ම, මනසෙහි උපදින සුඛය කයට සම්ප්‍රේෂණය කරවීම සම්බන්ධ ඉහත කී පළමු, දෙවන හා තුන්වන ධ්‍යානයන්හි දී මෙන් ම, රූපකායයෙහි හටගත් බැඳීමෙන් තොර ව වඩන අනෙකුත් ධ්‍යාන සියල්ල ම ව්‍යාධි දුක්ඛයන් මැඬසිටීමට පිටිවහල් වන බව සැලකිය හැකි ය.

ධ්‍යානසුඛ වශයෙන් විග්‍රහ කරන්නට යෙදුණු ඉහත කී සුඛ හුදෙක් කෙලෙස් හෙවත් අකුසල සහගත පැවැත්ම බැහැර කිරීමෙන් හා කාමසුඛ උත්පාදනය කරන ලෞකික පැවැත්මෙන් වෙන් වී උපයාගන්නා වූ සුඛයන් ය. ඉහත සඳහන් කරන්නට යෙදුණු අන්දමට ගෘහවාසය අත්හළ බෞද්ධ පැවිද්දා ධ්‍යාන මාර්ගයට එළඹෙන්නට සිත සමාධිගත කරන්නේ ද අකුසල බැහැර කරමිනි. ධ්‍යාන මාර්ගයට එළඹුණු තැන්

පටන් ක්‍රමයෙන් වින්දනය කරන සියලු ම සුඛයන් කුසලය හේතුවෙන් ම, කුසලයෙහි ප්‍රතිඵල වශයෙන් ම වින්දනය කරන ඒවා ය. **සංයුත්ත නිකායේ ටීකාව** ධ්‍යානසුඛ යන්න නිර්වචනය කර සිටින්නේ ද 'කුසල ධ්‍යානයන්ගේ විපාක වශයෙන් වින්දනය කරන සුඛ ධ්‍යානසුඛ වේ' යනුවෙනි.[49]

**අංගුත්තර නිකායේ** නවක නිපාතයේ එන ඣානානිස්සය සූත්‍රයේ දී බුදුන් වහන්සේ ප්‍රකාශ කර සිටින්නේ සියලු ම ධ්‍යානයන් හේතුවෙන් ආශ්‍රව ක්ෂය වන බව ය. නිදසුනක් ලෙස ප්‍රථම ධ්‍යානයේ දී එකී ධ්‍යානසංඛ්‍යාත වූ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණාදී වූ යම් වේදයිතයක් වේ නම්, එය රෝග, ගණ්ඩ, සල්ල, ආදියෙන් වූ දුක් සහිත, ආබාධ සහිත බව, පලොක හෙවත් පළුදු බව, සුඤ්ඤ බව හා අනාත්ම බව ධ්‍යානලාභියා විසින් මොනවට දකින්නේ ය. එමෙන් ම, එකී ධර්මයන් කෙරෙහි සිත් ඇලවීම නිර්වාණය විසින් නවතාලන්නේ යැයි අවබෝධ කොට ගන්නේ ය. එ බැවින් එකී ධර්මයන් කෙරෙහි සිත නවතා යම් ආකාර වූ සර්ව සංස්කාරයන්ගේ සමථයෙක් වේ නම්, සර්වෝපධීන්ගේ දුරලීමක් වේ නම් තෘෂ්ණාක්ෂයයක්, විරාගයක්, නිරෝධයක් හෝ නිර්වාණයක් ලොවෙහි වේ නම් එය ශාන්ත ය, ප්‍රණීත ය, යැයි සිතා එකී අමෘතධාතුවෙහි සිත බස්සවයි. එවිට එකී ධ්‍යානසංඛ්‍යාත වූ ආශ්‍රවයන් සියල්ලෙහි ම ක්ෂය සිදු වේ. එසේ නොමැති වුව හොත් එකී ධ්‍යානයට අනුරූප ධර්මරාගයෙන්, ධර්ම නන්දියෙන් ම, පඤ්ච ඕරම්භාගිය පරික්ෂයෙන් ඔපපාතික ලොවක උපත ලබයි. මෙකී කාරණය බුදු සමයෙහි අනුඥාත ධ්‍යාන නවය කෙරෙහි ම සාධාරණ තත්වයක් ලෙස අදාළ සූත්‍රයේ දී පෙන්නුම් කෙරෙයි.[50] මේ අනුව, ධ්‍යාන සුඛ යනු කුසල භාවනය කරමින්, පුද්ගල සන්තානගත ව බෙහෙවින් ගැඹුරු මට්ටමේ පවතින අකුසල බහා තබමින් උපයා ගන්නා සුඛ ලෙස බෞද්ධ සම්ප්‍රදාය තුළ විග්‍රහ වෙයි.

නමුත්, බෞද්ධ ධ්‍යානයන්ගේ ක්‍රියාකාරීත්වය අනුව ඒවා තාවකාලික ව වින්දනය කළ හැකි මට්ටමේ සුඛ වන අතර, ධ්‍යානයෙන් නැගී සිටි පසු ව එකී අනුභූතියෙන් මිදුණු තැනැත්තෙක් බවට පත් වේ. එහෙත් ඉහත කී සූත්‍රයට අනුව පැහැදිලි වන කාරණයක් වන්නේ එසේ ධ්‍යානයෙන් නැගී සිටිය ද නිර්වාණාපේක්ෂාවෙන් යුත් ශ්‍රාවකයා එයින් භාවනය කළ කුසලයට ප්‍රතිවිරුද්ධ අකුසලය වර්ධනය වන අන්දමේ ක්‍රියාකාරීත්වයකට නැවත යොමු නො වන බව ය. එමෙන් ම, එක්, එක් ධ්‍යාන රතියෙහි යුක්ත ව වාසය කරන්නා එයින් ඉදිරියට ගමන් කොට වෙනත් අධිගමයන් නො ලැබුව ද, ඉන් මෙපිට ඇති අකුසල චර්යාවේ ද නො ඇලෙන බව හා මරණින් මතු එකී ධ්‍යානයට අනුරූප ලෝකයන්හි හෙවත් සත්වාවාසයන්හි උපත ලබන බව ප්‍රකාශ කිරීමෙන් ම පැහැදිලි වේ. බුදුසමයට අනුව ලෝකෝත්තර වශයෙන් පවතින සැප වශයෙන් විග්‍රහ කළ හැක්කේ නිබ්බාණසුඛය හා අරහත් පුද්ගලයෙකු විසින් වින්දනය කරනු ලබන සුඛ යි. ලෝකෝත්තර අත්දැකීම්වලින් මෙපිට ඇති සියල්ලෙහි අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ස්වභාවය පිළිබඳ සලකන කල්හි ධ්‍යාන සුඛ සියල්ල ද ලෞකිකසුඛ යන පොදු වර්ගීකරණයට යටත් කිරීමට සිදු වේ. එසේ වුවත්, ධ්‍යාන සුඛයන්හි අන්තර්ගතයට කාමසුඛාස්වාදයක් හෝ වින්දනයක් ඇතුළත් නො වේ.

ධ්‍යාන අනුභූතිය විස්තර කරන සියලු ම සූත්‍රයන්හි ශ්‍රාවකයා සතු විය යුතු ප්‍රථම ගුණාංගය ලෙස විස්තර කර ඇත්තේ කාමයෙන් වෙන්වීම ය.[51]

බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද අන්දමට ධ්‍යාන ප්‍රතිපදාවේ ආරෝහණ වශයෙන් ඉහළට ගමන් කරන්නාට ඉදිරියෙන් ඇති ධ්‍යාන අනුභූතිය වින්දනය කළ හැක්කේ පෙර උපයාගත් ධ්‍යානය නිරෝධයෙනි. මෙසේ අවසන් ධ්‍යානය දක්වා ම වන ධ්‍යානයන්ගේ නිරෝධය බුදුසමය අපේක්ෂා කරන බව **දීඝ නිකායේ** සංගීති සූත්‍රය සඳහන් කරයි.[52] ඒ අනුව, එක් එක් ධ්‍යානයන්ගේ විමුක්තිය හා නිරෝධය පිණිස ධ්‍යාන වැඩීම බුදු සමය අපේක්ෂා කොට ඇති බව පෙනේ. එ හෙයින් නිර්වාණ අනුභූතියට මෙපිටින් ඇති තාවකාලික සුඛයන් වීම හේතුවෙන් ලෞකිකසුඛ ගණයට අයත් වන්නේ නමුදු, එකී සුඛ කුසල ප්‍රතිපදාවෙන් මිදී උපයාගන්නා ඒවා නො වීම සැලකිය යුතු කාරණයකි. විශේෂයෙන් ම, පළමු ධ්‍යානයේ සිට සිව්වැනි ධ්‍යානය දක්වා වන සියලු ම අත්දැකීම් අනෙකුත් ධ්‍යානයන්ටත් වඩා බෞද්ධ විමුක්ති මාර්ගයේ දී උපස්ථම්භක වන ප්‍රධාන සංධිස්ථානයන් ය. **ධම්මසංඝණිප්පකරණයේ** ලොකෝත්තරකුසල වර්ගීකරණයේ දී මෙම ධ්‍යානයන් කුසල යටතේ වර්ග කොට තිබීමෙන් ම මේ බව තවදුරටත් පැහැදිලි වේ.[53]

එ මෙන් ම, නිබ්බාණසුඛ සමග සසඳන කල ධ්‍යාන සුඛයන්ගේ අල්පාස්වාද බව ප්‍රකට වුව ද, අරහතුන්ට වුව ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සමවැදෙමින් වින්දනය කළ හැකි අන්දමේ සුඛ ලෙස ධ්‍යානසුඛ සූත්‍ර සාහිත්‍යයෙහි විවරණය කොට ඇත. මෙහි දී වඩා වැදගත් කාරණයක් ලෙස පෙනී යන්නේ (පඤ්ඤාවිමුත්තිය ලැබූ රහතුන් ද අතුළු ව) සියලු ම විමුක්ති ලාභීන්ට ධ්‍යාන සමාපත්තීන්ට සමවැදී ඒවායෙහි ආදීනවය පිළිබඳ මනා අවබෝධයෙන් යුක්ත ව නිරාමිස ව අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙකී සුඛ වින්දනයට හැකියාව පවතින බව බුදුන් වහන්සේ විසින් පෙන්වා දීම හා ඒ සඳහා භික්ෂූන් වහන්සේ උත්සුක කර වීම ය. ඒ සඳහා බෞද්ධ සාහිත්‍යයෙන් ගත හැකි හොඳම උදාහරණය වන්නේ පිරිනිවන් මඤ්චකයෙහි සැතපී සිටි බුදුන් වහන්සේ ද පිරිනිවන් පෑමට මත්තෙන් අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ධ්‍යාන නවයට ම සමවැදී, නැවත ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථධ්‍යානය දක්වා සමවැදී එකී ධ්‍යානානුභූතියෙන් පිරිනිවන් පෑ බව මහාපරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වීම ය.[54]

## සමාලෝචනය

බෞද්ධ නිර්වාණගාමී මාර්ගයට ශ්‍රද්ධාවෙන් පිළිපන් සියලු ම ශ්‍රාවකයන් විසින් විපස්සනාව පිණිස සිත නැඹුරු කිරීමේ අනුලෝම මාර්ගය ලෙසටත්, නිර්වාණයට මෙපිටින් සත්වාවාසයන්හි අස්ථිරත්වය අස්සාද, ආදීනව හා නිස්සරණ වශයෙන් පිළින කළ යුතු මාර්ගය ලෙසටත් ධ්‍යාන ප්‍රතිපදාව වැදගත් වෙයි. අනෙක් අතට, ප්‍රඥාවෙන් සසුනට එළඹ හික්මෙන ශ්‍රාවකයන් විසින් නිර්වාණානුභූතියෙන් අනතුරු ව එම අත්දැකීම් නැවත වින්දනය කරමින් කායික හා මානසික සුවය වින්දනය කිරීමට ද ධ්‍යාන ප්‍රතිපදාව මග පාදයි. මෙකී ප්‍රතිපදාවෙන් පුද්ගලයා වින්දනය කරන අනුභූතිය බුදු සමයෙන් හඳුනාගන්නේ තාවකාලික කුසල සම්පන්න වූ සුඛ

වින්දනයක් ලෙසයි. බුදුසමය අනුඥාත ධ්‍යාන ප්‍රතිපදාවේ දී එකී සුඛය, සුඛ නාම විසි පහක් (25)ඔස්සේ විග්‍රහ කරන අයුරු සූත්‍ර, අභිධර්ම, අටුවා සහ ටීකා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. මෙම කෙටි ශාස්ත්‍රීය ලේඛනයේ මූලික කාර්ය වූයේ එකී සුඛ වර්ග ධ්‍යාන අනුභූතිය ඔස්සේ වින්දනය කරන ආකාරය සහ ඒවායේ ස්වභාවය පැහැදිලි කිරීම ය.

## ආන්තික සටහන්

1 බුදුන් වහන්සේ ද විමුක්තිය ලැබීම උදෙසා අනුගමනය කළේ මෙකී ප්‍රතිපදාව බව **මජ්ඣිම නිකායේ** මහා සච්චක සූත්‍රයේ සඳහන් කරයි.

**ම.නි** *I*., මූලප.,මහාසච්චකසු., බු.ජ.මු., (2006), 560-592 පි. බ.

2 **ම.නි** *I*., මූලප.,මහාසච්චකසු., බු.ජ.මු., (2006), 560-592 පි. බ.

3 දීඝනිකායේ සංගීති සූත්‍රයේ දී එකී අත්දැකීම් සත්වාවාස ලෙස විග්‍රහ කර ඇත.

බ. **දී.නි.** *III*, පාථිකව., සංගීතිසු., බු.ජ.මු., (2006), 450- 452 පි.

4 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 134 පි.

5 **ම.නි.** *II*, මජ්ඣිමප., පොතලියසු., බු.ජ.මු., (2006), 44-48 පි.

6 **දී.නි.** *II*, මහාව., මහානිදානසු., බු.ජ.මු., (2006), 106-108 පි.

7 **අං. නි.** *IX*,නවකනිපා., ගාවීගාවීඋපමාසු., බු.ජ.මු., (2006), 486 පි.

8 ඉතරීතර සංතුට්ඨිය යනු කායපරිහරණයට පමණක් ප්‍රමාණවත් චීවර හා පිණ්ඩපාතයෙන් සංතුට්ඨිය ලැබීම ය.

9 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 124 පි.

10 *Pāli – English Dictionary*, Ed: Davids, T. W. Rhys., Stede, William., (1989), 121 P.

11 *Pāli – English Dictionary*, Ed: Davids, T. W. Rhys., Stede, William., (1989), 281 P.

12 දසම "**සමාසුඛ**න්ති අප්පනං වා උපචාරං වා පත්තසුඛං."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

13 "අයං සමාධිපච්චුප්පන්නසුඛොචෙවාතිආදීසුඅරහත්තඵලසමාධිඅධිප්පෙතො. **සොහිඅප්පිතප්පිතක්** ඛණෙසුඛත්තාපච්චුප්පන්නසුඛො. පුරිමොපුරිමොපච්ඡිමස්සපච්ඡිමස්සසමාධිසුඛස්සපච්චයත්තාආයතිංසුඛවිප ාකො."

*DA. III*, Uparipaṇṇāsaka, Dasuttarasuttavṇṇanā, CS Version 4.0.

14 "දසමෙ සමාධිසුඛන්ති අප්පනං වා උපචාරං වා පත්තසුඛං. අසමාධිසුඛන්ති තදුභයං අප්පත්තසුඛං."

*DA. III*, Uparipaṇṇāsaka, Dasuttarasuttavṇṇanā, CS Version 4.0.

15 "ඣානස්සාදංඣානනිකන්තිං ඣානසුඛඤ්චගහෙත්වා "සුඛාවහානී"තිආහ."

*STik. I*, Devatāsaṃyuttavaṇṇanā, CS Version 4.0.

16 "කුසලජ්ඣානස්සවිපාකජ්ඣානෙවලබ්භමානංසුඛං ඣානසුඛං."

එම.

17 "ඣානංසමාපජ්ජන්තොහි ඣානසුඛංඅත්තනිසංවිදහතිනාම."

*D.Ab.Tik. I*, Poṭṭhapādasuttavaṇṇanā, CS Version 4.0.

18 "පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති..."

**ම.නි.** *I*, මූලප., වත්ථූපම සු., බු.ජ.මු., (2006), 88 පි.

19 "සෙය්‍යථාපි, මහාරාජ, දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය), සායං න්හානීයපිණ්ඩි ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරා ඵුටා ස්නෙහෙන, න ච පග්ඝරණී; එවමෙව ඛො, මහාරාජ, භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි ඛො, මහාරාජ, සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච."

**දී.නි.** *I*, සීලක්ඛන්ධ ව., සාමඤ්ඤඵල සු., බු.ජ.මු., (2006), 128 පි.

20 බ. **ම.නි.** *III*,උපරිප., පඤ්චත්තයසු., බු.ජ.මු., (2006), 32-42 පි.

21 "අට්ඨමෙසප්පීතිකන්තිපඨමදුතියජ්ඣානසුඛං."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

22 "සප්පීතිකාරම්මණනන්ති සප්පීතිකංඣානද්වයංපච්චවෙක්ඛන්තස්සඋප්පන්නසුඛං."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

23 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 128 පි.

24 "උප්පාදෙත්වාඋප්පාදෙත්වාසුඛංවිහරන්තීතිතෙහෙට්ඨාපඨමජ්ඣානසුඛංනිබ්බත්තෙත්වාඋපරිවිපාකජ්ඣානසුඛංඅනුභවන්තීතිඅත්ථො."

*DA. III*, Uparipaṇṇāsaka, Saṅg´tisuttavṇṇanā, CS Version 4.0.

25 "සො විවිච්චෙව කාමෙහි, විවිච්ච අකුසලෙහි ධම්මෙහිසවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙවකායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙතිපරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙනඅප්ඵුටංහොති."

**දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 128 පි.

26 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 130 පි.

27 *MA. III*, Uparipaṇṇāsaka, Pañcattayasuttavṇṇanā, CS Version 4.0.

28 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 130 පි.

29 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 130-132 පි.

30 **ම.නි.***III*,උපරිප., පඤ්චත්තයසු., බු.ජ.මු., (2006), 40 පි.

31. "නිරාමිසංසුඛන්ති තතියජ්ඣානසුඛං."

*MA. III*, Uparipaṇṇāsaka, Pañcattayasuttavaṇṇanā, CS Version 4.0.

32 "ඣානසුඛමග්ගසුඛඵලසුඛනිබ්බානසුඛංපනනිරාමිසසුඛංනාම."

*Anudīpanīpātha*, CS Version 4.0.

33 "විවෙකජංපීතිසුඛාදීතිආදි-සද්දෙනසමාධිජං පීතිසුඛං, අපීතිජංකායසුඛං, සතිපාරිසුද්ධිජංඋපෙක්ඛාසුඛඤ්-චසඞ්ගණ්හාති."

*D.Tik. II*, Cakkavattisīhanāda suttavṇṇanā, CS Version 4.0.

34 "සාතසුඛන්තිතීසුඣානෙසුසුඛං."

*A.Tik. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

35 **සං.නි.** *V*, ඉන්ද්‍රියසං., උප්පටිපාටික සු., බු.ජ.මු., (2006), 378-383 පි.

36 **අං.නි.** *I*, දුක නිපා., සුඛ ව., බු.ජ.මු., (2006), 154 පි.

37 **දී.නි.** *I*, සීලක්ඛන්ධව., සාමඤ්ඤඵලසු., බු.ජ.මු., (2006), 132 පි.

38 ""ඉධුදායි, භික්ඛුපීතියාචවිරාගා..පෙ..තතියංඣානංඋපසම්පජ්ජවිහරති; ඉදම්පිඛොඅහං, උදායි, ඉඤ්ජිතස්මිංවදාමි. කිඤ්චතත්ථඉඤ්ජිතස්මිං? යදෙවතත්ථ උපෙක්ඛාසුඛංඅනිරුද්ධංහොතිඉදංතත්ථඉඤ්ජිතස්මිං."

**ම.නි.** *II*,මජ්ඣිමප., ලටුකිකොපම සු., බු.ජ.මු., (2006), 202 පි.

39 "තෙරසමෙරූපාරම්මණන්තිරූපාවචරචතුත්ථජ්ඣානාරම්මණං, යංකිඤ්චිරූපංආරබ්භඋප්පජ්ජනකංවා."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

40 **අං.නි.** *I*, දුක නිපා., සුඛ ව., බු.ජ.මු., (2006), 154 පි.

41 "විවෙකජංපීතිසුඛං, සමාධිජංපීතිසුඛං, අපීතිජංකායසුඛං, සතිපාරිසුද්ධිජංඤාණසුඛන්තිචතුබ්බිධම්පිඣානසුඛං පටිපක්ඛතොනික්ඛන්තතංඋපාදායනෙක්ඛම්මසුඛන්තිවුච්චතීතිආහිනෙක්ඛම්මසුඛංවින්දතීති."*A.Tik., IV*, Catukkanipāta, Uruvelavagga, CS Version 4.0.

42 "සප්පීතිකාරම්මණනන්ති සප්පීතිකංඣානද්වයංපච්චවෙක්ඛන්තස්සඋප්පන්නසුඛං. නිප්පීතිකාරම්මණෙ පිඑසෙවනයො."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

43 "අරූපාරම්මණන්ති අරූපාවචරජ්ඣානාරම්මණං, යංකිඤ්චි අරූපං ආරබ්භ උප්පජ්ජනකං වාති."

*AA. II*, Dukanipātavṇṇanā, Sukhavagga, CS Version 4.0.

44 **ම.නි.** *II*,මජ්ඣිමප., බහුවේදනීයසු., බු.ජ.මු., (2006), 100-104 පි.

45 **ඛු.නි.**, චුල්ලනිද්., ඛග්ගවිසාණසු.නිද්., බු.ජ.මු., (2006), 610 පි.

46 *DA. I*, Sīlakkhandhavagga, Mahālisuttavaṇṇanā, CS Version 4.0.

47 "සුඛාභිය්‍යොසොමනස්සන්තිසමාපත්තිතොවුට්ඨිතස්ස ඣානසුඛපච්චයාඅපරාපරංසොමනස්සංඋප්පජ්ජති."

*DA. II*, Mahāvagga, Janavasabhasuttavaṇṇan, CS Version 4.0.

48 "බලවතරසුඛන්තිසමුප්පන්නබ්‍යාධිදුක්ඛතොබලවතරං, තංඅභිභවිතුංසමත්ථංඣානසුඛංඋප්පජ්ජති."

*M.Tik.*, Mūḷapaṇṇāsaka,Ākhaṅkeyyasuttavaṇṇanā, CS Version 4.0.

49 "කුසලජ්ඣානස්සවිපාකජ්ඣානෙවලබ්භමානංසුඛං ඣානසුඛං."

*S.Tik.*, Devatāsaṃyutta, Upanīya suttavaṇṇanā, CS Version 4.0.

50 **අං.නි.** *IX*, නවකනිපා., මහාව., ඣානනිස්සයසු., බු.ජ.මු., (2006), 488 පි.

51 **දී.නි.** *III*, පාථිකව., සංගීතිසු., බු.ජ.මු., (2006), 454 පි.

52 **දී.නි.** *III*, පාථිකව., සංගීතිසු., බු.ජ.මු., (2006), 456 පි.

53 **ධම්මසංඝණිප්පකරණ** *I*, චිත්තුප්පාදකණ්ඩ, බු.ජ.මු., (2006), 122 පි.

54 **දී.නි.** *II*, මහාව., මහාපරිනිබ්බානසු., බු.ජ.මු., (2006), 246 පි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**දී.නි.** *I*, *II*, *III*, බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

**ම.නි.** *II*, බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

**සං.නි.** *V*, බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

**අං.නි.** *I*, *IX*, දුක නිපා., බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

**ඛු.නි.**, චුල්ලනිද්., බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

**ධම්මසංඝණිප්පකරණ** *I*, බු.ජ.මු., (2006), දෙහිවල; බෞ.සං.ම.

***DA***. *I, II, III,* CS Version 4.0.

***MA***. *III*, CS Version 4.0.

***AA.*** *II*, CS Version 4.0.

***D.Tik.*** *II*, CS Version 4.0.

***M.Tik.***, CS Version 4.0.

***S.Tik.*** *I*, CS Version 4.0.

***A.Tik.*** *II*, *IV*, CS Version 4.0.

***D.Ab.****Tik. I*, CS Version 4.0.

***Anudīpanīpāṭha*****,** CS Version 4.0.

***Pāli – English Dictionary*****,** Ed: Davids, T. W. Rhys., Stede, William., (1989), New Delhi; Munshiram Manoharlal Publishers Pvt. Ltd.